# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## Police Media Division


තැ.පෙ. අංකය / த.பெ.இ / P.O. Box No — 517

ෆැක්ස් / தொலை நகல் / Fax — 011-2329500

දුරකථනය / தொலைபேசி / Telephone — 011-2384024, 011-2395605

වෙබ් ලිපිනය / இணைய தளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E mail — dir.media@police.lk


මගේ අංකය / எனது இல / My No — 411 / 2022

ඔබේ අංකය / உமது இல / Your No —

දිනය / திகதி / Date — 2022.03.12 පැය 1700

**මාධ්‍ය නිවේදන**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**“සියළු දෙනාම කියවිය යුතු පොලිස් පණිවිඩය” යනුවෙන් සමාජ මාධ්‍ය ජාලා වල සංසරණය වන ව්‍යාජ පණිවිඩයක් සම්බන්ධව**

සමාජ මාධ්‍ය ජාලා වල මේ වන විට ***සියළු දෙනාම කියවිය යුතු පොලිස් පණිවිඩය***යනුවෙන් **“ප්‍රවේශම් වන්න ආර්ථික අර්බුද”** ලෙස කරුණු 22 ක් ඇතුලත් කර අවසානයේ **“පරිස්සමින් ඉන්න පොලිස් දෙපාර්තමේන්තුව”** යනුවෙන් සඳහන් කරමින් ව්‍යාජව සකස් කරන ලද පණිවිඩයක් සංසරණය වෙමින් පවතී.

මෙවැනි පණිවිඩයක් ශ්‍රී ලංකා පොලිසිය මඟින් මාධ්‍ය ආයතන වෙත හෝ කිසිදු සමාජ මාධ්‍ය වෙත හෝ වෙනත් ආකාරයකින් හෝ මහජනතාව වෙත නිකුත් කර නොමැති බවට සඳහන් කරන අතර, මෙවැනි පණිවිඩ මගින් මහජනතාව නොමඟ යාම මෙන්ම ශ්‍රී ලංකා පොලිසියද අපකීර්තියට පත්වේ.

ශ්‍රී ලංකා පොලිසිය මඟින් මහජනතාව දැනුවත් කල යුතු කරුණු තිබේ නම් පොලිස් මාධ්‍ය කොට්ඨාසය මඟින් මාධ්‍ය නිවේදන ලෙස නිකුත් කර මහජනතාව දැනුවත් කිරීමට කටයුතු කරනු ලබයි.

එබැවින් මෙවැනි ව්‍යාජ ලෙස සකසන ලද පණිවිඩවලට නොරැවටෙන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටින අතර, මෙම ව්‍යාජ පණිවිඩය නිකුත් කරන ලද පුද්ගලයන් අනාවරණය කර ගැනීම සඳහා විමර්ශණ කටයුතු මේ වන විට ක්‍රියාත්මකව ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**